# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## පළමු වාර පරීක්ෂණය - 2018

| චිත්‍ර කලාව - II | 13 ශ්‍රේණිය | කාලය පැය තුනයි. |
|---|---|---|

**ස්වභාවිකත්ව අධ්‍යයනය සහ නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය**

- සිසුන් සඳහා උපදෙස් :-
  ඔබේ විභාග අංක / නම, පැහැදිලිව චිත්‍රය පිටුපස සඳහන් කරන්න.

- පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන / ඔබ ඉදිරියේ ඇති ද්‍රව්‍ය කට්ටලය ඇඳ වර්ණ ගන්වන්න.
  * චිත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතුය. (දියසායම් චිත්‍රයක් නම්)
  * කඩදාසි තලය අර්ථවත්ව යොදා ගනිමින් ද්‍රව්‍ය සමූහය සම්පිණ්ඩනය කරන්න.
  * ද්‍රව්‍යවල සහ පැළැටියේ ගති ලක්ෂණ මතුපිට ස්වභාවය, පරිමාණ මෙන්ම පර්යාවලෝක ලක්ෂණ පිළිබඳව ද සැලකිල්ල යොමු කරන්න.
  * ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ ඒ මතට වැටී ඇති අඳුර ආලෝක තත්වයන් පිළිබඳවද සැලකිල්ලට ගෙන චිත්‍රය වර්ණ කරන්න.
  * පෙරබිම සහ පසුබිම පිළිබඳ අවධානය යොමු කරන්න.
  * ද්‍රව්‍ය සමූහය තබා ඇති ලැල්ල ඔබට අවශ්‍ය පරිදි ගැලපෙන ආකාරයට වෙනස් කර ඇඳීමට අවසර නැත.

| | | |
|---|---|---|
| **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** | | |
| **පළමු වාර පරීක්ෂණය - 2018** | | |
| **චිත්‍ර කලාව - II** | **13 ශ්‍රේණිය** | **කාලය පැය තුනයි.** |


**ස්වභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය**

- ශාලාධිපති සඳහා උපදෙස්

  මෙහි සඳහන් ද්‍රව්‍ය සමූහය ඇස් මට්ටමට පහතින් සිටින සේ පිළියෙල කරන්න.

**අදාළ ද්‍රව්‍ය :-**

* ඩ්‍රෝවිං ලෑල්ලක්
* බෝතලයක්
* පොල් ගෙඩියක්
* පෙට්ටියක්
* ලොකු ශබ්ද කෝෂයක් හෝ පොතක්
* රෙදි කැබැල්ලක්
* ක්‍රෝටන් අත්තක්



**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

**පළමු වාර පරීක්ෂණය - 2018**

| | | |
|---|---|---|
| **චිත්‍ර කලාව - III** | **13 ශ්‍රේණිය** | **කාලය පැය තුනයි.** |

- **පහත සඳහන් ''අ'', ''ආ'' හා ''ඉ'' කොටස් තුනෙන් එක් කොටසක් තෝරා ගන්න. එම කොටසේ එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.**
- **ඔබේ විභාග අංකය හා තෝරා ගත් ප්‍රශ්න අංකය පසුපිටේ පැහැදිලිව ලියන්න.**
- **චිත්‍රය භාර දෙන විට එය වියළී තිබිය යුතුය.**
- **ඕනෑම වර්ණ මාධ්‍යයක් හෝ මාධ්‍ය කීපයක් මිශ්‍ර කරමින් භාවිතා කළ හැකිය.**
- **ටිෂූ කඩදාසි අවශ්‍ය අයට සපයනු ලැබේ.**

---

## ''අ'' කොටස - චිත්‍ර සංරචනය

- පහත සඳහන් මාතෘකාවලින් එකක් පමණක් තෝරා ගන්න.

1. ගම්මානයක හෝ නගරයක කලබලකාරී වෙළඳාම්පොලක්
2. වැල්ලට මාළු ඔරු කීපයක් පැමිණි විගස වැල්ලට පැමිණි ජනතාව
3. වනයේ විලක් අසල දිය බොන වන සතුන්

## ''ආ'' කොටස - මෝස්තර නිර්මාණය

- **පහත සඳහන් මාතෘකාවලින් එකක් පමණක් තෝරා ගන්න.**

4. ශ්‍රී ලාංකික පැරණි චිත්‍ර ශිල්පියා විසින් අඳින ලද විවිධ මෝස්තර/රටා උපයෝගී කර ගනිමින් පතාකයට සුදුසු චිත්‍ර ඇඳ වර්ණ කරන්න.
5. ස්වභාවික මල් සහ කොළ ආශ්‍රයෙන් චීත්ත රෙද්දකට සුදුසු මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න.
6. බතික් සරමකට හෝ කමිසයකට සුදුසු මෝස්තර ඇඳ වර්ණ කරන්න.

## ''ඉ'' කොටස - ග්‍රැෆික් චිත්‍ර

- **පහත සඳහන් මාතෘකාවලින් එකක් පමණක් තෝරා ගන්න.**

7. ශ්‍රී ලංකාවේ වෙස් මුහුණු නැමැති පොතට සුදුසු පිටකවරයක් ඇඳ වර්ණ කරන්න.
8. මත් උවදුර දුරු කරමු යන්න තේමා කර ගනිමින් වර්ණවත් පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කරන්න.
9. පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උළෙල සඳහා ආරාධනා පත්‍රයක ඉදිරිපස පිටුව නිර්මාණය කර වර්ණ කරන්න.